# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1892/35 - 2014 දෙසැම්බර් මස 10 වැනි බදාදා - 2014.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### 1991 අංක 7 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය පිළිබඳ නියෝග

1991 අංක 7 දරන බස්නාහිර පළාතේ, මෝටර් වාහන ප්‍රඥප්තියේ 129(1) වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදාහැරීම්, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග.

ඇන්ටනී නිමල් ලාන්සා වර්ණකුලසූරිය,
ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදාහැරීම්,
සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන,
සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා
සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත් සභාව.

2014 නොවැම්බර් මස 04 වන දින,
කොළඹ දී ය.

නියෝගය

මෙම නියෝගය මෝටර් වාහන හිඟ ගාස්තුවලට අදාළ දඩ මුදල් සඳහා සහන ලබාදීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2015.01.01 දින සිට 2015.03.31 දින දක්වා මාලිගාවත්ත මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් කාර්යාලය හා බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක වන්නේය.

බලපත්‍ර ගාස්තු ගෙවීම හිඟ තබා ඇති වාහන හිමියන් එසේ හිඟ තබා ඇති බලපත්‍ර ගාස්තු 2015 ජනවාරි මස 01 වැනි දින සිට 2015 මාර්තු මස 31 වැනි දින දක්වා කාලය තුළ ගෙවනු ලැබුවහොත් එම බලපත්‍ර ලාභීන්ට පහත සඳහන් එනම්,

01. පළාත් සභා පිහිටුවීමට පෙර (1991) කාලය තුළ රැස්වී ඇති හිඟ හා දඩ මුදල් කපා හැරීම.

02. හිමිකරුගේ පාලනයෙන් බැහැර රේගු, පොලිස්, අධිකරණ භාරයේ තිබූ නිශ්චිත කාලය තුළ හිඟ හා දඩ නිදහස් කිරීම (හිමිකරු නිවැරදිවන අවස්ථාවක පමණි).

03. උතුරු නැගෙනහිර යුද්ධය හේතුවෙන් අතුරුදහන්වී නැවත අධිකරණය මගින් නිදහස් කල වාහනවල පොලීසිය හෝ අධිකරණ භාරයේ තිබූ කාලයට අදාළව හිඟ ආදායම් නිදහස් කිරීම.

04. දීර්ඝ කාලයක් ආදායම් බලපත්‍ර නොතිබූ අනෙකුත් වාහන සඳහා දඩ සහන ලබාදීම.

4:1 ප්‍රවර්තන වර්ෂය හැර වර්ෂ 05ක් දක්වා ආදායම් බලපත්‍ර ලබා නොගත් වාහන සඳහා අයවිය යුතු දඩමුදලින් 50% ක් කපා හැරීම.

4:2 ප්‍රවර්තන වර්ෂය හැර වර්ෂ 05 කට වැඩි කාලයක් ආදායම් බලපත්‍ර ලබා නොගත් වාහන සඳහා වර්ෂ 05 කට වැඩිවන කාලය වෙනුවෙන් සම්පූර්ණ දඩ මුදලම කපා හැරීම.

යන සහන හිමිවේ.

2015.04.01 දින වන විටද හිඟ හා දඩ මුදල් නොගෙවන වාහන වේ නම් එම වාහන තවදුරටත් බස්නාහිර පළාතේ තිබේදැයි භෞතිකව පරීක්ෂා කිරීම සිදු කෙරෙන අතර, එසේ පරීක්ෂා කිරීම සඳහා බස්නාහිර පළාතේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ සේවයෙහි නියුතු ග්‍රාම නිළධාරි හෝ බස්නාහිර පළාතේ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් / ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකුට මෙයින් බලය පවරමි. ඒ අනුව එම වාහනය තිබේ යැයි සැලකිය හැකි ඕනෑම භූමියකට ඇතුළු වීමට මෙයින් අවකාශ ලැබේ.

ඇන්ටනී නිමල් ලාන්සා වර්ණකුලසූරිය,
ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදාහැරීම්,
සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන,
සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා
සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත් සභාව.

12 - 868

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.